දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )MH/TA/04/MLT/SP/
My No. )04/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.10. 24
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health& Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02-168/2025

රේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්/ආයතන ප්‍රධානීන් වෙත,
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් වෙත.

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (2022.01.01 දින සිට 2025.06.30 දින දක්වා)**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ **2022.01.01** දින සිට **2025.06.30** දින දක්වා පවත්නා විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු **32** ක් පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්ගේ අංක HSC/06/SP(MLT)/05/2025 හා 2025.10.14 දිනැති ලිපිය මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි උක්ත සේවාවෙහි අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. අයදුම්කරුවන් විසින් තනතුරට අදාළව 2016.02.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුව පහත සඳහන් කොන්දේසි සියල්ල සපුරා තිබිය යුතු වේ.**

I. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. 2022.06.30 දිනට හෝ 2022.12.31 දිනට හෝ 2023.06.30 දිනට හෝ 2023.12.31 දිනට හෝ 2024.06.30 දිනට හෝ 2024.12.31 දිනට හෝ 2025.06.30දිනට අදාළ තනතුරෙහි අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

VI. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතුය.

VII. I ශ්‍රේණියට උසස් කිරීම රේඛීය අමාත්‍යාංශය හෝ පළාත් සභා මඟින් සිදුකර තිබිය යුතුය.

VIII. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සටහන :-

i. 2022.06.30 දිනට හෝ 2022.12.31 දිනට හෝ 2023.06.30 දිනට හෝ 2023.12.31 දිනට හෝ 2024.06.30 දිනට හෝ 2024.12.31 දිනට හෝ 2025.06.30 දිනට සේවයේ යෙදී සිට ඉන් අනතුරුව සේවයෙන් විශ්‍රාම ගොස් සිටින ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ද මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අතර පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන්නේ පුරප්පාඩු ඇති වීමෙන් පසුව එළඹෙන ජනවාරි 01 සහ ජූලි 01 දිනට වේ.

**03.** **අයදුම්පත්‍ර :-**

I. අදාළ අයදුම්පත්‍ර මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය අනුව පමණක් සකස් කළ යුතු වේ.

II. 2022.06.30 දිනට හෝ 2022.12.31 දිනට හෝ 2023.06.30 දිනට හෝ 2023.12.31 දිනට හෝ 2024.06.30 දිනට හෝ 2024.12.31 දිනට හෝ 2025.06.30 දිනට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු හෝ නිලධාරිනියක සේවයෙන් විශ්‍රාම ගොස් ඇති විටකදී, ඔහු හෝ ඇය අවසන්වරට සේවය කරනු ලැබූ ආයතනයේ ප්‍රධානියා මඟින් අයදුම්පත්‍ර යොමුකළ යුතු වේ.

III. ඉහත 03 (II) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් මේ වන විට සේවයේ යෙදී නොසිටින බැවින්, අදාළ ආයතන ප්‍රධානියා විසින් මෙම චක්‍රලේඛය ඔවුනගේ පෞද්ගලික ලිපිනයන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යවා දැනුවත් කළ යුතු වේ.

IV. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

**04.** **අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :-**

I. මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත් වල සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව සහතික කළ යුතුය. එය ආයතන ප්‍රධානියාගේ වගකීමක් වන අතර, අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ආයතන ප්‍රධානියාගේ පෞද්ගලික අවධානය යොමු විය යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ආයතන ප්‍රධානීන් විසින් **2025.11.15** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", නො. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට එවිය යුතුය.

III. **ප්‍රමාද වී ලැබෙන හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ. තැපෑලේ දී සිදුවන අස්ථානගතවීම් පිළිබඳ අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :-**

තනතුරුවල පවතින පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා එම කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහළම ලකුණු ලැබූවන්ගේ ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ. අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ අදාළ තනතුරු දරන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**06. ලකුණු දීමේ ක්‍රමය :-**

**06.1 සේවා පුරුද්ද (උපරිම ලකුණු 60)**

I. **Iශ්‍රේණියේ සේවා කාලය සඳහා උපරිම ලකුණු 20**

II. **අධි ශ්‍රේණියේ සේවා කාලය සඳහා උපරිම ලකුණු 40**

සටහන :-

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන අතර තනතුරට අයදුම් කිරීම සඳහා අවශ්‍යවන මූලික සුදුසුකම සඳහා අදාළ කරගනු ලබන සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

**6.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 30)**

| | |
|---|---|
| විෂයානුබද්ධ සිව් අවුරුදු විශේෂවේදී උපාධියක් | - ලකුණු 25 |
| සාමාන්‍ය විද්‍යාවේදී විද්‍යා උපාධියක් | - ලකුණු 20 |
| කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ උපාධියක් | - ලකුණු 10 |
| විෂයානුබද්ධ උසස් ඩිප්ලෝමාවක් (වසර 01ක්හෝ ඊට වැඩි) | - ලකුණු 10 |
| විෂයානුබද්ධ ඩිප්ලෝමාවක් (මාස 06ක්හෝ ඊට වැඩි) | - ලකුණු 05 |
| විෂයානුබද්ධ සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 03ට හෝ ඊට වැඩි) | - ලකුණු 03 |
| කළමනාකරණ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (උපරිම පාඨමාලා 02ක් සඳහා) | - ලකුණු 2.5 |
| | **- උපරිම ලකුණු 30 –** |

සැලකිය යුතුයි :-

i. අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා, තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකමට අදාල වූ අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

ii. උපාධි සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත ආයතනයකින් ලබා තිබිය යුතු අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ඩිප්ලෝමා/ සහතික පත්‍ර පාඨමාලා පමණක් මෙහිදී සලකනු ලබයි.

iii. තනතුරට අයත් රාජකාරි ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමාව මාස 06කට නොඅඩු විය යුතු අතර තනතුරට අයත් රාජකාරි ක්ෂේත්‍රයට අදාල සහතික පත්‍ර පාඨමාලාව මාස 03කට නොඅඩු විය යුතුය.

6.3 **විශේෂ කුසලතා (උපරිම ලකුණු 10)**

සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ප්‍රකාශයට පත් කර ඇති විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන (Research Publication) මේ යටතේ බඳවා ගැනීමේ සුදුසුකමට අදාළ උපාධියේ හෝ මින් පෙර ලකුණු උපයාගත් කිසියම් උපාධියකට අදාළ පර්යේෂණ නිබන්ධන සලකා බලනු නොලැබෙන අතර පිළිගත් ජර්නලයක හෝ වෙබ් අඩවියක අදාළ පර්යේෂණය ප්‍රකාශයට පත් කර ප්‍රසිද්ධියට පත් කර තිබිය යුතුය.

| | |
|---|---|
| පළමු කර්තෘ ලෙස ප්‍රකාශිත පර්යේෂණ ප්‍රකාශන 01ට | - ලකුණු 05 බැගින් |
| ප්‍රකාශිත පර්යේෂණ ප්‍රකාශනයක සහභාගීත්වය සඳහා | - ලකුණු 02 බැගින් |

i. විශේෂ පුහුණු - තොරතුරු තාක්ෂණය / ඉංග්‍රීසි (මාස 06 කට හෝ ඊට වැඩි)

- ලකුණු 2.5 බැගින්

**- උපරිම ලකුණු 10 -**

සටහන : 6.3 හි අනු අංක i සඳහා ලකුණු ලබා දිය යුතු ආකාරය ඇමුණුම I මගින් දක්වා ඇත.

**07.** ඉහත අංක 06 හි සඳහන් පරිදි ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් හට පුරප්පාඩු සඳහා අයදුම්කරුවන්ගේ කැමැත්තේ අනුපිළිවෙළට මනාප ලකුණු කිරීමෙන් අනතුරුව විශේෂ ශ්‍රේණියේ උසස්වීම් ලබාදෙන අතර, සම ලකුණු ලබාගන්නා අවස්ථාවක දී ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකස් කර ඊට අනුකූලව උසස්වීම් ලබාදෙනු ලැබේ.

**08.** පත්වීම් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයට අතිරේක වියදමක් නොවන පරිදි කෙටි දැනුම්දීමකින් පත්වීම භාරගත යුතුවන අතර, පත්වීම ලැබෙන ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. එසේ කටයුතු කරනු නොලබන පත්වීම්ලාභීන්ගේ පත්වීම දින 14 කින් අනතුරුව අවලංගු කරනු ලැබේ.

**09.** මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත. තවද, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

**<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (2022.01.01 දින සිට 2025.06.30 දින දක්වා)</u>**

## 1 කොටස : අදාළ නිලධාරියා/නිලධාරිනිය විසින්ම සම්පූර්ණ කළ යුතුය.

I. (අ) නිලධාරියා/නිලධාරිනියගේ මුලකුරු සමඟ නම :- ..........................................................

..........................................................................................................................

(ආ) සම්පූර්ණ නම :- ..........................................................................................................

..........................................................................................................................

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :- ...........................................................................................

(ඉ) උපන්දිනය :- ..................................................................................................................

II. සේවය කරන හෝ අවසන් වරට සේවය කළ ආයතනය :- ...........................................................

III. (අ) කාර්යාලයීය ලිපිනය :- ...............................................................................................

(ආ) පෞද්ගලික ලිපිනය :- .....................................................................................................

(ඇ) දූරකථන අංකය (පෞද්ගලික) :- .......................................................................................

IV. (අ) පුහුණුවට බැඳුණු දිනය :- ..........................................................................................

(ආ) පත්වීම ස්ථිර කරන ලද දිනය:- ........................................................................................

(ඇ) II 'අ' ඛණ්ඩයට උසස් වූ දිනය:- ......................................................................................

(ඈ) I ශ්‍රේණියට උසස් වූ දිනය :- ..........................................................................................

(ඉ) අධි ශ්‍රේණියට උසස් වූ දිනය :- ......................................................................................

(එම උසස්වීම් ලිපියෙහි සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය)

V. සේවයෙන් විශ්‍රාම ගෙන සිටින නිලධාරියෙකු/නිලධාරිනියක නම් විශ්‍රාම ගිය දිනය :- .....................

............................................................ ............................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**02 කොටස :-(විෂය භාර නිලධාරියා/නිලධාරිනිය විසින් අදාළ නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය)**

I. (අ) සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) ලබා ඇති/නැති බව :-
.................................................................................................................................
(ආ) වැටුප් රහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) ලබා ඇත්නම් ඊට අදාළ කාල සීමාව සහ හේතුව :-
.................................................................................................................................
.................................................................................................................................

II. (අ) සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති/නැති බව :-
.................................................................................................................................
(ආ) සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන නොමැති නම් ඊට හේතු :-
.................................................................................................................................
.................................................................................................................................

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව අනුමත නව බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කර ඇති/නැති බව (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :-
.................................................................................................................................

IV. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති නම් දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :-
.................................................................................................................................

V. පළාත් රාජ්‍ය සේවයේ සිට ස්ථාන මාරු මත හෝ රෝහල් පවරා ගැනීම මත මධ්‍යම රාජ්‍ය සේවයට පැමිණි නිලධරයෙකු නම් මධ්‍යම රජයට අන්තර්ග්‍රහණය කර ඇති/නැති බව (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- .................................................................................

VI. (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ වැටුප් රහිත විදේශීය නිවාඩු ලබා ගෙන ඇති/නැති බව :-
.................................................................................................................................
(ආ) එලෙස වැටුප් රහිත විදේශීය නිවාඩු ලබා ගෙන ඇත්නම් ලබාගත් කාලසීමාව :-

අවුරුදු :- ......................
මාස :- ......................
දින :- ......................

(ඇ) විදේශ නිවාඩු ලබා ගෙන ඇති කාලසීමාව තුළ ගිවිසුම් ගත පරිදි විදේශ මුදල් සම්ප්‍රේෂණය කර ඇති/නැති බව :-
.................................................................................................................................

VII. (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) යටතේ වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ගෙන ඇති/නැති බව :-
.................................................................................................................................
(ආ) එලෙස වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ගෙන ඇත්නම් ලබාගත් කාලසීමාව :-

අවුරුදු :- ......................
මාස :- ......................
දින :- ......................

(ඇ) දේශීය නිවාඩු ලබා ගෙන ඇති කාලසීමාව තුළ ගිවිසුම් ගත පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි දායක මුදල් ප්‍රේෂණය කර ඇති/නැති බව :-
.................................................................................................................................

VIII. (අ) සේවා කාලය තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා ඇති/නැති බව :-

.............................................................................................................................

(ආ) විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් ලබා තිබේ,

(i) වරද සිදු කල දිනය :- ........................................................................................

(ii) චෝදනා පත්‍ර නිකුත් කර තිබේ නම් එහි අංකය හා දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- ........................................................................................

(iii) විනය නියෝගයක් ලබා දී තිබේ නම් එහි අංකය හා දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- ........................................................................................

IX. (අ) නිලධාරියාට සේවා කාලය තුළ සේවය හැර යාමේ නිවේදන නිකුත් කර ඇති/නැති බව :-

.............................................................................................................................

(ආ) එවැනි සේවය හැරයාමේ නිවේදන නිකුත් කර ඇත්නම්, නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමේ ලිපියක් නිකුත් කර ඇති/නැති බව :-

.............................................................................................

(ඇ) ඒ අනුව නැවත රාජකාරී භාරගත් දිනය :-

................................................................................

X. (අ) නිලධාරියා ඉල්ලා අස්වීමකින් පසු නැවත සේවයේ පිහිටුවීමක් සිදු කර ඇති/නැති බව :-

.............................................................................................................................

(ආ) ඒ අනුව නැවත රාජකාරී භාරගත් දිනය :-

................................................................................

XI. (අ) ද්විතීයන පදනම මත මුදාහැර තිබේද? :- .........................

(ආ) තිබේනම් අදාල කාලය :- .........................

XII. යාවත්කාලීන කරන ලද වර්යා සටහන (සහතික කරන ලද පිටපතක් අමුණන්න):- .........................

XIII. (අ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව 2017.01.01 දින සිට 2025.06.30 දින දක්වා කාලය තුළ කාර්ය සාධන මට්ටම (ඉතා හොඳයි/හොඳයි/සතුටුදායකයි/අසතුටුදායකයි ලෙස සටහන් කරන්න) :-

1 වසර .........................................................

2 වසර .........................................................

3 වසර .........................................................

4 වසර .........................................................

5 වසර .........................................................

6 වසර .........................................................

7 වසර .........................................................

8 වසර .........................................................

9 වසර .........................................................

(ආ) වෙනත් කරුණු :-

.............................................................................................................................

අදාළ නිලධාරියා/නිලධාරිනිය ගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත දක්වා ඇති විස්තර හා අයදුම්පතේ අංක 01 හා 02 කොටස් වල සියලු තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

| ................................... | ................................... | ................................... |
|---|---|---|
| දිනය | විෂයභාර නිලධාරියාගේ නම | විෂයභාර නිලධාරියාගේ අත්සන |

### 3 කොටස: ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය :-

මාගේ අධීක්ෂණය යටතේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ සේවය කරන ............................................. නිලධාරියා/නිලධාරිනිය අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේ නම් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

.......................................                ...........................................................................

දිනය                විශේෂ ශ්‍රේණියේ නිලධාරියාගේ/අංශ ප්‍රධානියාගේ නිල මුද්‍රාව හා අත්සන

### 4 වන කොටස : පරිපාලන නිලධාරියාගේ/නිලධාරිනියගේ නිර්දේශය

අදාළ නිලධාරියා/නිලධාරිනියගේ අයදුම්පතේ 1 හා 2 කොටස් වල දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව සහතික කරමි. අයදුම්පත්‍රය නිර්දේශ කරමි.

.......................................                ...........................................................................

දිනය                පරිපාලන නිලධාරියාගේ අත්සන

### 5 වන කොටස : ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර දරන ............................................................... මයා/මිය/මෙනවිය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ අධි ශ්‍රේණියට / I වන ශ්‍රේණියට ....................................... දින සිට උසස්වීම් ලබා ඇති බවත්, අයදුම්පත් කැඳවන අවසන් දිනට අඛණ්ඩ හා සතුටුදායක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන බවත් සහතික කරමි. වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම් සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පත නිර්දේශ කරමි.

.......................................                ...........................................................................

දිනය                ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම I

<u>පර්යේෂණ / ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. ප්‍රකාශන :

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර ඇති අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා / උද්ධෘත / අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යයන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

**<u>සැ.යු. : උක්ත ප්‍රකාශන එකී අවස්ථාවන් සඳහා යොදාගත් බව සනාථ කිරීම අයදුම්කරුගේ වගකීම වේ.</u>**

II. කතෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් සහභාගී වූ කතෘන් අතර සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.

III. එකම දත්ත / පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි / පශ්චාත් උපාධි පුහුණුවෙහි කොටසක් ලෙස පළකරන ලද ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

V. ඉහත සියළුම ප්‍රකාශන අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පෙර ප්‍රකාශයට පත් කර තිබිය යුතුය.

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )MH/TA/04/MLT/SP/
My No. )04/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )2025.10. 24
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

**General Circular Letter No:- 02-168/2025**

All Directors of Hospitals/All Heads of Institutions under the Line Ministry,
Directors of the Special Campaigns,

**Promotion to Special Grade of the post of Medical Laboratory Technologist belonging to the Service of Professions Supplementary to Medicine (From 01.01.2022 to 30.06.2025)**

Applications are called from officers who have satisfied the below mentioned qualifications and conditions, in Supra Grade / Grade I of the Service of Professions Supplementary to Medicine to fill 32 vacancies exist in Special Grade of the post of Medical Laboratory Technologist belonging to the above service from 01.01.2022 to 30.06.2025 as per the approval granted by the letter No. HSC/06/SP(MLT)/05/2025 dated 14.10.2025 of the Secretary to the Health Service Committee of the Public Service Commission.

**02. Below mentioned all conditions should be satisfied by applicants as per the Scheme of Recruitment approved by the Public Service Commission relevant to the post on 26.02.2016.**

I. Should be a citizen of Sri Lanka.

II. Should be of an excellent character.

III. Should be an officer in Supra Grade or should have completed an active and satisfactory service period of five (05) years in Grade I of the relevant post as at 30.06.2022 or 31.12.2022 or 30.06.2023 or 31.12.2023 or 30.06.2024 or 31.12.2024 or 30.06.2025.

IV. Should not have been subject to a disciplinary punishment in terms of the provisions set out in the Public Service Commission Circular No. 01/2020.

V. Should have proved a performance at the satisfactory level or above the satisfactory level in terms of the approved performance appraisal procedure during the period of five (05) years prior to the date of promotion.

VI. Should have passed the first Efficiency Bar Examination of Grade I.

VII. Should have been done the promotion to Grade I by the Line Ministry or Provincial Councils.

VIII. Should have completed all the qualifications in every respect by the date specified in the notification for calling applications that the qualifications must have been completed. And, copies of the relevant certificates should be submitted along with the application for verification of qualifications.

Note:

i. Officers who were in the service as at 30.06.2022 or 31.12.2022 or 30.06.2023 or 31.12.2023 or 30.06.2024 or 31.12.2024 or 30.06.2025 and have retired from the service, and have satisfied the aforementioned qualifications, are also eligible to apply for this and Vacancies will be filled as at 1st of January or 1st of July which comes after occurring vacancies.

**03. Applications: -**

I. Applications should only be prepared in accordance with the specimen form attached herewith.

II. When a retired officer had satisfied the qualifications for promotion to the Special Grade as at30.06.2022 or 31.12.2022 or 30.06.2023 or 31.12.2023 or 30.06.2024 or 31.12.2024 or 30.06.2025 he/she should forward their applications through the Head of Institution where he/she served at last.

III. Since, the officers who have qualified under No. 03 (II) above, are not in the service at present, they should be informed by the respective Head of Institution by sending this circular to their private addresses under registered post.

IV. The words **"Promotion to Special Grade of the post of Medical Laboratory Technologist"** should be mentioned on top left-hand corner of the envelope in which the duly filled applications are enclosed.

**04. Method of Application**

I. Applications which are completed in accordance with the specimen form of the application appended to this, should be submitted to the respective Heads of Institutions. Particulars furnished in the applications should be compared with the records in the personal files of the relevant officers and should be certified by the Heads of Institutions after being satisfied with the accuracy of the said particulars. It is a responsibility of the Head of Institution, and the Head of Institution should pay their personal attention to the completion of every section of the application and accuracy of the particulars.

II. Duly completed applications should be sent by the respective Heads of Institutions to reach "Director (Admin) 02, Ministry of Health, "Suwasiripaya", No. 385, Rev. BaddegamaWimalawansaTheroMawatha, Colombo 10" under registered cover on or before **15.11.2025**.

III. **Delayed or applications with false particulars will be rejected without any notice**. And also, appeals submitted later on this regard will not be considered. The ministry will not responsible for misplacing of applications in the post.

## 05. Method of Recruitment

Based on the vacancies of the post, Applications are called according to the notice approved by the Health Service Committee of the Public Service Commission to evaluate the qualification by an interview board approved by the said committee. Appointment will be done according to the merit and vacancies by the Health Service Committee of the Public Service Commission from those who received the highest marks. A number equal to twice the number of vacancies or five (05) persons; whichever is highest, will be called for the interview in the order of seniority of the officers who hold the relevant posts in Supra Grade / Grade I.

## 06. Marking Scheme

### 06.1 Service Experience (Maximum 60 marks)

I. For period of service in Grade I – maximum 20 marks
II. For period of service in Supra Grade – maximum 40 marks

Note :

Marks will be given for the seniority as per the Public Service Commission Circular No. 01/2019. Marks will not be given for the service period which will be related for the basic qualification required to apply for the post.

### 06.2 Additional Educational Qualifications (Maximum 30 marks)

| | |
|---|---|
| Subject related four-year Special degree | - 25 marks |
| General Science B.Sc. degree | - 20 marks |
| Degree in management field or a degree in Information Technology | - 10 marks |
| Subject related higher diploma (01 year or more) | - 10 marks |
| Subject related diploma (06 month or more) | - 05 marks |
| Subject related Certificate course (03 month or more) | - 03 marks |
| diploma in management field (maximum 02 courses) | - 2.5 marks |

**Maximum 30 marks**

It should be noted:

i. For additional educational qualification, marks will not be given for the educational qualification related to the basic qualification for recruitment to the post
ii. The degree qualification must be obtained from an institution approved by the University Grants Commission and only Diploma/ Certificate courses offered by an institution recognized by the University Grants Commission, the Ministry of Health or the Ministry of Education will be considered here.

iii. The diploma relevant to the job field of the position should not be less than 06 month and the certificate course relevant to the job field of the position should not be less than 03 months.

**06.3 Special skills (10 marks)**

i. Scientific Research publications related to the Health field.
Under this, research publications of the degree relevant to the recruitment or any degree which previously earn marks will not be considered and the research should be published and made public in the recognized journal or in a web site.

| | |
|---|---|
| For one published research publication, as the first author | - 05 marks each |
| For participation in a published research publication | - 02marks each |

ii. Special trainings - Information Technology / English (06 month or more)

**Maximum 10 marks**

Note : Marking scheme for 6.3 is stated in the annexure I

**07.** Applicants who have secured highest marks as per the order of marks obtained as mentioned in No.06 above, will be granted promotions in Special Grade after making preferences for the vacancies according to their order of preference. In the event of obtaining equal marks, a seniority list will be prepared and promotions will be granted as per the said list.

**08.** Applicants who will be selected for granting the appointment, should accept the appointment on short notice without making an extra expenditure to the government, and should be willing to serve in any station where the appointment will be granted. If not, the appointment will be cancelled after 14 days.

**09.** In case of any matter not covered by this notification, the decision of the Health Service Committee of the Public Service Commission will be final. And, in the event of any inconsistency between Sinhala, Tamil and English text of this notification, the Sinhala text shall prevail.

By the order of the Health Service Committee of the Public Service Commission,

Dr. Anil Jasinghe,
Secretary.

Dr. Anil Jasinghe
Secretary
Ministry of Health & Mass Media
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10.

**Specimen Form of Application**

**Promotion to Special Grade of the post of Medical Laboratory Technologist belonging to the Service of Professions Supplementary to Medicine**

**(From 01.01.2022 to 30.06.2025)**

**Part-01: To be filled by the officer concerned himself/herself**

1. a) Name with Initials: ...........................................................................

   b) Name in Full: ...........................................................................

   c) National Identity Card No.: ...........................................................................

   d) Date of Birth: ...........................................................................

2. Institution where the officer is serving / served at last: ...........................................................................

3. a) Official Address: ...........................................................................

   b) Personal Address: ...........................................................................

   c) Telephone No (Personal): ...........................................................................

4. a) Date of Recruitment to the Training: ...........................................................................

   b) Date of Confirmation in the appointment: ...........................................................................

   c) Date of Promotion to Segment II "A": ...........................................................................

   d) Date of Promotion to Grade I: ...........................................................................

   e) Date of Promotion to Supra Grade: ...........................................................................

   (Should attach a certified copy of the said promotion letter)

5. Date of retirement, if a retired officer: ...........................................................................

.................................... ......................................

Date Signature of the Applican

**Part 02 :- (To be filled by the Officer-In Charge of the subject according to the personal file of the officer concerned)**

I. a) Whether the officer has obtained no-pay leave (except maternity leave) during the service period :- ........................................

b) If the officer has obtained other no-pay leave, relevant periods and reasons :-
.........................................................................................................
.........................................................................................................

II. a) Whether the all salary increments have been earned on the due date:-
.........................................................................................................

b) If not, give Reasons :- ...........................................................................
.........................................................................................................

III. Whether the officer has been absorbed to the approved new Scheme of Recruitment as per the Public Administration Circular 06/2006 (Attach a certified copy) or not :-
..........................................

IV. If the officer has acquired the official language proficiency, mention the date (Attach a certified copy) :- ...................................................................................

V. Whether or not the officer has been absorbed to the Central Government from Provincial Public Service, if the officer has reported to the Central Government due to transfers or taking over of Hospitals (Attach a certified copy) :-
.........................................................................................................

VI. a) Whether the officer has obtained no-pay foreign leave as per the Public Administration Circular No. 14/2022 or not :- .....................................................................

b) If so, mention Relevant Periods:
Years :- ............................
Months :- ............................
Dates :- ............................

c) Whether the officer has remitted foreign currency as agreed during the period of obtained Foreign Leave or not :- ...................................................................................

VII. Whether the officer has obtained leave with no pay to be spent within the country as per the Public Administration Circular No. 14/2022 or not :-..........................................................

b) If so, mention relevant periods:
Years :- ............................
Months :- ............................
Dates :- ............................

c) Whether the officer has remitted the contributions to the Widows/Widowers and Orphans Pension Fund as agreed during the Period of obtained local Leave or not :-
.........................................................................................................

VIII. a) Whether the officer has subjected to any disciplinary inquiry or disciplinary punishment during the service period or not :-

.....................................................................................................................

b) If any,

i) Date of the offence was Committed :- ..................................................................

ii) No. and Date of the Charge Sheet, if issued any (Attach a certified copy) :-

.....................................................................................................................

iii) No. and Date of the Disciplinary Order, if issued any (Attach a certified copy) :-

.....................................................................................................................

IX. a) Whether the Notice of Vacation of Post has been issued during the service period of the Officer or not :-..................................................................................................

b) If a Notice of Vacation of Post has been issued as so, whether a Letter of Reinstatement has been issued or not :- ...........................................................................

c) Accordingly, date of assumption of duty :- ...................................................

X. a) Whether the officer has been reinstated after Resignation of the Officer or not :-

.....................................................................................................................

b) Accordingly, Date of assumption of Duty :-......................................................

XI. a) Released on a Secondary basis? :- ..................................................................

b) Relevant Period of any :- ................................................................................

XII. Updated History Sheet (Attach a certified copy) :- ..................................................

XIII. a) Level of performance during the period of 01.01.2017 to 06.30.2025 as per the Approved Performance Appraisal Scheme (VeryGood/Good/Satisfactory/Unsatisfactory) :-

Year 1 ............................................

Year 2 ............................................

Year 3 ............................................

Year 4 ............................................

Year 5 ............................................

Year 6 ............................................

Year 7 ............................................

Year 8 ............................................

Year 9 ............................................

b) Other matters :-

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

I certify that the particulars furnished above and the particulars furnished Part 01 & 02 in the application are correct according to the personal file of the officer concerned.

| .................. | .............................. | .................................. |
|---|---|---|
| Date | Name of the Officer-In Charge of the subject | Signature of the Officer-In Charge of the Subject |

**Part-03: Recommendation of the immediate Supervisory Officer: -**

If Mr./Mrs./Ms. …………………… who is serving in the post of Medical Laboratory Technologist under my supervision, has completed the required qualifications, I recommend to promote the officer to the Special Grade in the post of Medical Laboratory Technologist.

………………… ………………………………

Date Signature and Official Stamp of the Officer in Special Grade / Head of the Branch

**Part-04: Recommendation of the Administrative Officer**

I certify that all the particulars furnished from Part 1 and 2 in the application of the officer concerned are correct and recommend the application.

………………… ………………………………

Date Signature of the Administrative Officer

**Part-05: Recommendation of the Head of Institution**

I certify that all information furnished above of Mr./Mrs./Ms..…………who is holding the post of Medical Laboratory Technologist, is correct, he/she has been promoted to Supra Grade / Class I in the post of Medical Laboratory Technologist from the date of ………., and has completed a continuous and satisfactory service period of 05 years as at closing date of the application. I recommend this application submitted for promotion to Special Grade in the post of Medical Laboratory Technologist belonging to theService of Professions Supplementary to Medicine.

………………… ………………………………

Date Signature and Official Stamp of the Head of the Institution

**Annexure I**

**Criteria to be applied for evaluation of Researches/Publications.**

I. Publications.

(a) Journal papers - A full copyof essay or article withan academic importance published in a peer-reviewed numbered publication series.

(b) Conference papers/excerpts/final transcript of essays -

Reports used inconferences, a meeting, seminars, academic, conferences, discussion boards, workshop or academic seminars with an academic value

**N.B:- It is the responsibility ofthe applicant to prove that the foresaid publications were used for the said occasions.**

II. In the case of publications published with several authors participation, marks will be awarded proportionately among the participants.

III. Publications which are published based on the same data/research information and, have arrived to almost similar conclusions, will not be considered separately. In such acase, only one publication will be considered for awarding marks.

IV. Marks will not be awarded for publications which were published as a part of thepostgraduate qualification/Postgraduate training for which marks weregiven at the interview.

V. All the above publications must have been published before the date of qualification examining.